රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.08.19**

**නිවේදන අංකය: 839/2021**
**නිකුත් කළ වේලාව: 08.30**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ**
**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු**

**කොවිඩ් ආසාදිතයන් ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම හා කළමනාකරණය සඳහා අද (19) සිට නව ක්‍රමවේදයක්**

කොවිඩ් 19 අසාදිතයන්ගේ රෝගී තත්වය අනුව ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම හෝ නිවෙස් වළ තබා කළමනාකරණය සඳහා අද අගෝස්තු 19 සිට බස්නාහිර පළාත ඇතුලත නව ක්‍රමවේදයක් හඳුන්වා දෙමින් කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය නිකුත් කර ඇති නිවේදනය සුදුසු පරිදි ප්‍රචාරය සඳහා ඔබවෙත යොමුකරමි.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

**කොවිඩ් - 19 රෝගීන් ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමුකිරීම සහ කළමනාකරණය සඳහා අද 2021 අගෝස්තු මස 19 දින සිට හඳුන්වාදෙන නව ක්‍රමවේදය**

01. නව ක්‍රමය දුරකථන ඇමතුම් සහ කෙටි පණිවිඩ ඔස්සේ ක්‍රියාත්මක කෙරේ.
02. කොවිඩ් - 19 අසාදිතයන් පහත සඳහන් තොරතුරු ඇතුලත් කෙටි පණිවිඩයක් 1904 දුරකථන අංකයට යොමුකළ යුතුය.
    - අ. රෝග තත්වයේ ස්වභාවය
        - I. ශ්වසන අපහසුතා ඇති රෝගීන් - A <Space>
        - Ii. උණ තත්වයෙන් පෙලෙන රෝගීන් - B
        - iii. කිසිදු රෝග ලක්ෂණයක් නැති රෝගීන් - C
    - ආ. වයස <Space>
    - ඇ. ජා.හැ.අංකය <Space>
    - ඈ. ලිපිනය <Space>

03. SMS මගින් ලැබෙන තොරතුරු කොවිඩ් 19 රෝගය පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය විසින් අදාල ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සඳහා වෛද්‍ය කණ්ඩායම් වෙත දැනුම් දෙනු ලැබේ.
04. රෝගීන් සපයන තොරතුරු වර්ගීකරණයෙන් පසු දුරකථන අංක 247 මගින් ඔවුන් සම්බන්ධකොටගෙන රෝග තත්වය නිශ්චයකර ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කරනු ඇත. (ඒ සඳහා ගිලන් රථ සේවා සහ සෙසු ප්‍රතිකාර පහසුකම් සැලසෙයි)
05. වෛද්‍ය කණ්ඩායමක් නිවෙස් නිරෝධායනයට යොමු කෙරෙන රෝගීන් සමග නිරතුරුව සම්බන්ධ වෙමින් අවශ්‍ය සේවා ලබා දෙනු ඇත. ( මේ සඳහාම වෙන් වූ දුරකථන අංක 1390 ඔස්සේ එම පහසුකම් සලසනු ලැබේ.)

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை வீதி, கொழும்பு 05, இலங்கை.
(+94 11) 2515759
(+94 11) 2514753
www.news.lk